

ශ්‍රී බුද්ධ වර්ෂ 2569 - 70 **බුදුසරණ** රාජ්‍ය වර්ෂ 2026

# 2026 පෝය ලබන ගෙවෙන වේලාවන් සහ සිල් සමාදන් විය යුතු දවස්

## දෙළොස් මහේ පොහොය වරුණ

### දුරුතු පසළොස්වක පොහොය

තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සිදු වූයේ ඓතිහාසික දුරුතු පෝ දිනක ය. තුන් බෑ ජටිලයන් ප්‍රධාන දහසක් සව්වන් සදහම් මඟට හරවා ඔවුන් හැම අරි සඟ ගණ බවට පත්කොට වදළ බුදුපියාණන් වහන්සේ අනතුරුව හෙළදිව බිම් තැන්නේ මහවැලි ගඟ අසබඩ මිනිපේ නම් සරු දනව් පියසට ගුවන් ගැබින් පහළ ව සවනක් බුදුරැස් මාලාවන්ගෙන් දිලිහී වැඩහුන් සේක.

### නවම් පසළොස්වක පොහොය

සැරියුත් මුගලන් දෙනම අගසව් තනතුරු ලබන ලද්දේ ද, සම්බුද්ධ ශාසනවංශ කතාවෙහි ප්‍රථම මහා සංඝ සන්නිපාතය සිදුවූයේ ද නවම් පුන් පොහෝ දිනක ය.

### මැදින් පසළොස්වක පොහොය

ලෝකාර්ථ චර්යාවෙහි යෙදුණු බුදුන් වහන්සේ විසි දහසක් මහ සඟරුවන සමඟ රජගහනුවර සිට තමන් වහන්සේගේ උපන් ගම වූ කිඹුල්වත් පුරයට ගමනාරම්භ කළේ මැදින් පෝදක ය.

### බක් පසළොස්වක පොහොය

බුදුපියාණන් වහන්සේගේ මහා ගුණ කඳ මනසට නංවන අසිරිමත් දිනයකි, බක් පොහොය දිනය.මේ සුන්දර දිවයින දෙවැනි වරටත් බුදු සිරිපා පහසින් පිවිතුරු බවට පත් වූයේ ද, බුදුරජාණන් වහන්සේගේ සවනක් රැස් කඳින් නාගදීපය ආලෝකවත් වූයේ ද, දහම් අමා මිහිරෙන් නොයෙක් දෙනා නිවී සැනසී ගියේ ද බක් පුර පොහෝ දිනක දී ය.

### වෙසක් පසළොස්වක පොහොය

තිලොවග සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ලොව පහළවීම, බුදුවීම, පිරිනිවන් පෑම යන අසිරිමත් මංගල කරුණු රැසකින් පූජනීයත්වයට, ඓතිහාසිකත්වයට පත්වුණු ශ්‍රී වෛශාඛ දිනය සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේ පරම පූජනීය ආගමික දිනය යි.

### පොසොන් පසළොස්වක පොහොය

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ දඹදිව් තලයේ සිට හෙළ දිව් තලයේ මිස්සක පව්වට සදහම් පණිවුඩය රැගෙන වැඩම කළ ඓතිහාසික දිනය පොසොන් පොහොය දිනය යි.

**දුරුතු මස පෝය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ජන. 02 සිකුරා. | අ.භා. 06.56න් | පුර පසළොස්වක ලබා | 03 සෙන. | අ.භා. 03.37න් | ගෙවේ | 03 සෙන. | සිල් |
| ජන. 10 සෙන. | පූ.භා. 08.27න් | අව අටවක ලබා | 11 ඉරිද. | පූ.භා. 10.23න් | ගෙවේ | 10 සෙන | සිල් |
| ජන. 18 ඉරිදා | පූ.භා. 00.04න් | අමාවක ලබා | 19 සඳුදා | පූ.භා. 01.21න් | ගෙවේ | 18 ඉරිදා | සිල් |

**නවම් මස පෝය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ජන. 25 ඉරිදා | අ.භා. 11.09න් | පුර අටවක ලබා | 26 සඳු | අ.භා. 09.17න් | ගෙවේ | 26 සඳුදා | සිල් |
| පෙබ. 01 ඉරිදා | පූ.භා. 05.54න් | පුර පසළොස්වක ලබා | 02 සඳු. | පූ.භා. 03.41න් | ගෙවේ | 01 ඉරිදා | සිල් |
| පෙබ. 09 සඳුදා | පූ.භා. 05.03න් | අව අටවක ලබා | 10 අඟ. | පූ.භා. 07.29න් | ගෙවේ | 09 සඳුදා | සිල් |
| පෙබ. 16 සඳුදා. | අ.භා. 05.32න් | අමාවක ලබා | 17 අඟ. | අ.භා. 05.28න් | ගෙවේ | 16 සඳුදා | සිල් |

**මැදින් මස පෝය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| පෙබ. 24 අඟහ. | පූ.භා. 07.04න් | පුර අටවක ලබා | 25 බදා. | පූ.භා. 04.53න් | ගෙවේ | 24 අඟහ. | සිල් |
| මාර්. 02 සඳුදා. | අ.භා. 06.01න් | පුර පසළොස්වක ලබා | 03 අඟ. | අ.භා. 05.13න් | ගෙවේ | 02 සඳුදා. | සිල් |
| මාර්. 11 බදාදා. | පූ.භා. 01.56න් | අව අටවක ලබා | 12 බ්‍රහ. | පූ.භා. 04.21න් | ගෙවේ | 11 බදාදා. | සිල් |
| මාර්. 18 බදාදා. | පූ.භා. 08.25න් | අමාවක ලබා | 19 බ්‍රහස් | පූ.භා. 06.54න් | ගෙවේ | 18 බදාදා | සිල් |

**බක් මස පෝය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| මාර්. 25 බදාදා. | අ.භා. 01.54න් | පුර අටවක ලබා | 26 බ්‍රහස්. | පූ.භා. 11.53න් | ගෙවේ | 25 බදාදා | සිල් |
| අප්‍රේ. 01 බදාදා. | පූ.භා. 07.09න් | පුර පසළොස්වක ලබා | 02 බ්‍රහස්. | පූ.භා. 07.44න් | ගෙවේ | 01 බදාදා | සිල් |
| අප්‍රේ. 09 බ්‍රහස්. | අ.භා. 09.19න් | අව අටවක ලබා | 10 සිකුරා. | අ.භා. 11.15න් | ගෙවේ | 10 සිකුරා | සිල් |
| අප්‍රේ. 16 බ්‍රහස්. | අ.භා. 08.08න් | අමාවක ලබා | 17 සිකුරා. | අ.භා. 05.20න් | ගෙවේ | 17 සිකුරා | සිල් |

**වෙසක් මස පෝය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අප්‍රේ. 23 බ්‍රහස්. | අ.භා. 08.55න් | පුර අටවක ලබා | 24 සිකු. | අ.භා. 07.28න් | ගෙවේ | 24 සිකුරා | සිල් |
| අප්‍රේ. 30 බ්‍රහස්. | අ.භා. 09.16න් | පුර පසළොස්වක ලබා | 01 සිකුරා | අ.භා. 10.56න්. | ගෙවේ | 01 සිකුරා | සිල් |
| මැයි 09 සෙන. | අ.භා. 02.01න් | අව අටවක ලබා | 10 ඉරිදා | අ.භා. 03.03න් | ගෙවේ | 09 සෙන. | සිල් |
| මැයි. 16 සෙන. | පූ.භා. 05.13න් | අමාවක ලබා | 17 ඉරිදා | පූ.භා. 01.31න් | ගෙවේ | 16 සෙන. | සිල් |

**අධි පොසොන් පෝය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| මැයි. 23 සෙන. | පූ.භා. 05.06න් | පුර අටවක ලබා | 24 ඉරිද. | පූ.භා. 04.30න් | ගෙවේ | 23 සෙන. | සිල් |
| මැයි. 30 සෙන. | පූ.භා. 12.00න් | පුර පසළොස්වක ලබා | 31 ඉරිද. | අ.භා. 02.17න් | ගෙවේ | 30 සෙන. | සිල් |
| ජුනි. 08 සඳුදා. | පූ.භා. 03.25න් | අව අටවක ලබා | 09 අඟහ. | පූ.භා. 03.23න් | ගෙවේ | 08 සඳුදා. | සිල් |
| ජුනි. 14 ඉරිදා. | අ.භා. 12.20න් | අමාවක ලබා | 15 සඳුදා | පූ.භා. 08.26න් | ගෙවේ | 14 ඉරිදා. | සිල් |

**පොසොන් මස පෝය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ජුනි 21 ඉරිදා. | අ.භා. 03.28න් | පුර අටවක ලබා | 22 සඳුදා. | අ.භා. 03.46න් | ගෙවේ | 21 ඉරිදා | සිල් |
| ජුනි. 29 සඳුදා. | පූ.භා. 03.08න් | පුර පසළොස්වක ලබා | 30 අඟහ. | පූ.භා. 05.28න් | ගෙවේ | 29 සඳුදා | සිල් |
| ජූලි 07 අඟහ. | අ.භා.01.22න් | අව අටවක ලබා | 08 බදාදා. | අ.භා. 12.19න් | ගෙවේ | 07 අඟහ | සිල් |
| ජූලි 13 සඳුදා. | අ.භා. 06.52න් | අමාවක ලබා | 14 අඟහ. | අ.භා. 03.17න් | ගෙවේ | 14 අඟහ | සිල් |

**ඇසළ මස පෝය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ජූලි. 21 අඟහ. | පූ.භා. 04.06න් | පුර අටවක ලබා | 22 බදාදා | පූ.භා. 05.18න් | ගෙවේ | 21 අඟහ. | සිල් |
| ජූලි 28 අඟහ. | අ.භා. 06.19න් | පුර පසළොස්වක ලබා | 29 බදාදා. | අ.භා. 08.05න් | ගෙවේ | 29 බදාදා | සිල් |
| අගෝ. 05 බදාදා. | අ.භා. 08.40න් | අව අටවක ලබා | 06 බ්‍රහස්. | අ.භා. 06.50න් | ගෙවේ | 06 බ්‍රහස්. | සිල් |
| අගෝ. 12 බදාදා. | පූ.භා. 01.56න් | අමාවක ලබා | එදිනම | අ.භා. 11.10න් | ගෙවේ | 12 බදාදා | සිල් |

**නිකිණි මස පෝය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අගෝ. 19 බදාදා. | අ.භා. 07.24න් | පුර අටවක ලබා | 20 බ්‍රහස්. | අ.භා. 09.22න් | ගෙවේ | 20 බ්‍රහස් | සිල් |
| අගෝ. 27 බ්‍රහස්. | පූ.භා. 09.09න් | පුර පසළොස්වක ලබා | 28 සිකුරා. | පූ.භා. 09.47න් | ගෙවේ | 27 බ්‍රහස්. | සිල් |
| සැප්. 04 සිකුරා. | පූ.භා. 02.26න් | අව අටවක ලබා | 05 සෙන. | පූ.භා. 00.14න් | ගෙවේ | 04 සිකුරා. | සිල් |
| සැප්. 10 බ්‍රහස්. | පූ.භා. 10.37න් | අමාවක ලබා | 11 සිකුරා. | පූ.භා. 09.00න් | ගෙවේ | 10 බ්‍රහස්. | සිල් |

**බිනර මස පෝය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සැප්. 18. සිකුරා. | අ.භා. 01.04න් | පුර අටවක ලබා | 19 සෙන. | අ.භා. 03.28න් | ගෙවේ | 18 සිකුරා. | සිල් |
| සැප්. 25 සිකුරා. | අ.භා. 11.05න් | පුර පසළොස්වක ලබා | 26 සෙන. | අ.භා. 10.16න් | ගෙවේ | 26 සෙන. | සිල් |
| ඔක්. 03 සෙන. | පූ.භා. 08.02න් | අව අටවක ලබා | 04 ඉරිදා | පූ.භා. 05.53න් | ගෙවේ | 03 සෙන. | සිල් |
| ඔක්. 09 සිකුරා. | අ.භා. 09.40න් | අමාවක ලබා | 10 සෙන. | අ.භා. 09.24න් | ගෙවේ | 10 සෙන. | සිල් |

**වප් මස පෝය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ඔක්. 18 ඉරිදා | පූ.භා. 08.29න් | පුර අටවක ලබා | 19 සඳුදා. | පූ.භා. 10.51න් | ගෙවේ | 18 ඉරිදා | සිල් |
| ඔක්. 25 ඉරිදා | පූ.භා. 11.54න් | පුර පසළොස්වක ලබා | 26 සඳුදා | පූ.භා. 09.41න් | ගෙවේ | 25 ඉරිදා. | සිල් |
| නොවැ.01 ඉරිදා | අ.භා. 02.57න් | අව අටවක ලබා | 02 සඳුදා. | අ.භා. 01.15න් | ගෙවේ | 01 ඉරිදා. | සිල් |
| නොවැ.08ඉරිදා | පූ.භා. 11.32න් | අමාවක ලබා | 09 සඳුදා. | අ.භා. 12.36න් | ගෙවේ | 08 ඉරිදා. | සිල් |

**ඉල් මස පෝය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| නොවැ.17 අඟහ. | පූ.භා. 04.21න් | පුර අටවක ලබා | 18 බදාදා. | පූ.භා. 06.06න් | ගෙවේ | 17 අඟහ. | සිල් |
| නොවැ.23 සඳුදා. | අ.භා. 11.41න් | පුර පසළොස්වක ලබා | 24 අඟහ. | අ.භා. 08.22න් | ගෙවේ | 24 අඟහ. | සිල් |
| දෙසැ. 01 අඟහ. | පූ.භා. 00.17න් | අව අටවක ලබා | එදින. | අ.භා. 11.19න් | ගෙවේ | 01 අඟහ. | සිල් |
| දෙසැ. 08 අඟහ. | පූ.භා. 04.15න් | අමාවක ලබා | 09 බදාදා. | පූ.භා. 06.23න් | ගෙවේ | 08 අඟහ. | සිල් |

**උඳුවප් මස පෝය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දෙසැ. 16 බදාදා | අ.භා. 10.43න් | පුර අටවක ලබා | 17 බ්‍රහස්. | අ.භා. 11.23න් | ගෙවේ | 17 බ්‍රහස්. | සිල් |
| දෙසැ. 23 බදාදා. | පූ.භා. 10.47න් | පුර පසළොස්වක ලබා | 24 බ්‍රහස්. | පූ.භා. 06.59න් | ගෙවේ | 23 බදාදා. | සිල් |
| දෙසැ. 30 බදාදා | අ.භා. 12.43න් | අව අටවක ලබා | 31 බ්‍රහස්. | අ.භා. 12.38න් | ගෙවේ | 30 බදාදා. | සිල් |

## දෙළොස් මහේ පොහොය වරුණ

### ඇසළ පසළොස්වක පොහොය

බරණැස ඉසිපතනාරාමයේ දී දුකත්, දුකට හේතුවත්, නිවනත්, එය ලබන පිළිවෙතත් යන සත්‍ය සතර ලොව පළමුවරට දේශනා කළ දිනය යි, ඇසළ පෝදා.

### නිකිණි පසළොස්වක පොහොය

ඇසළ අව පෑළවිය ද භික්ෂූන් වහන්සේ පෙර වස් එළඹීමට නියමිත දිනයකි. නිකිණි පසළෙ ාස්වක පොහෝදා පොහොය කොට නිකිණි අව පෑළවිය, පසුවස් එළ ඹීම යි,සසුන් පිළිවෙත වන්නේ.

### බිනර පසළොස්වක පොහොය

බුද්ධ නියමය අනුව භික්ෂූන් වහන්සේ විහාරාරාමයන්හි නිබඳ ව වස් වසමින් බණ භාවනාවල යෙදෙමින් සම්බුද්ධ ශාසන පරමාර්ථ ඉටු කර ගන්නා කාලයකි. මෙහෙණ සසුනේ ආරම්භය සිදුවිය.

### වප් පසළොස්වක පොහොය

වස්සාන සෘතුවේ මුල් තුන් මස භික්ෂූන් වහන්සේ වස් වසා වැඩ සිටින කාලය යි. වස් සාර මාසයේ අන්තිම මාසය කඨින චීවර පූජා මාසය යි. එය චීවර මාසය නමින් ද ව්‍යවහාර කැරේ.

### ඉල් පසළොස්වක පොහොය

ශාසනික ඉතිහාසයේ අනුස්මරණීය සිද්ධීන් කීපයකට මුල් වූ පොහොය දිනයකි. මෙතේ බෝසත්තුමා විවරණය ලැබීම, ප්‍රථම රහතන් වහන්සේ හැට නම ධර්ම ප්‍රචාරය සඳහා ගමන් ඇරඹීම, පසු වස් පවාරණය කළ යුතු දිනය ද, සැරියුත් මහරහතන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවීම ද යන කරුණු රැසක් අනුස්මරණය කැරෙන්නේ ඉල් පෝදා ය.

### උඳුවප් පසළොස්වක පොහොය

උඳුවප් පොහොය දින සිදු වූ සංඝමිත්තා මහ රහත් මෙහෙණින් වහන්සේගේ ලංකාගමනය ගැන, ජය ශ්‍රී මහා බෝ සමිඳුන් ගැන, ලංකා මෙහෙණ සසුන ගැන සිහි කරන කවර අයකුට වුව ද ඇති වනුයේ මහා සැනසිල්ල කි.

පෙරවස් එළැඹීම - ජූලි මස 30 වැනි බ්‍රහස්පතින්දා පසුවස් එළැඹීම - අගෝස්තු මස 27 වැනි බ්‍රහස්පතින්දා
පෙරවස් පවාරණය - ඔක්තෝබර් මස 25 වැනි ඉරිදා
පසුවස් පවාරණය - නොවැම්බර් මස 24 වැනි අඟහරුවාදා

සිතුවම - සමන් ශ්‍රීකාන්ත

වර්ෂ 2026 ක් වූ ජනවාරි 03 සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.